**සිංහල පරිවර්තනය**

උතුරු පළාත් රා.සේ.කො.සභා චක්‍රලේඛ අංක: 08/ 2021

මගේ අංකය : **NP/07/10/04/55**
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත්, යාපනය
16.04.2021

ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාරවර ලේකම්,
අමාත්‍යාංශ ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
උතුරු පළාත.

## උතුරු පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධිශ්‍රේණියට ප්‍රවීනතා මට්ටමින් තනතුරු උසස් කිරීම සඳහා වූ තරග විභාගය – 2019(2020)

**1.** රාජ්‍ය සේවයේ පත්වීම් කළමනාකරණය වන පොදු කොන්දේසින්, 2013.12.11වන දිනැති අංක 1840/34 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදලයේ පළ කරන ලද කළමානකරණ සේවා නිලධාරී සේවයේ සේවා ව්‍යාවස්ථා සංග්‍රහය අනුගමනය කර සකස් කරන ලද උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද උතුරු පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය මගින් නිර්දේශ කර ඇති කොන්දේසින් හා එම සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ ඇති කරන ලද කිසියම් සංශෝධන, හා මතු පැමිණෙන කාලවලදී සංශෝධනය කිරීමට අපෙක්ෂිත කිසියම් සංශෝධනයන්ට යටත්ව පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධිශ්‍රේණිය සඳහා තිබෙන පුරප්පාඩු වලින් 50% ක් ප්‍රවීනතා මට්ටමින් තනතුරුඋසස් කිරීම මගින් සම්පූර්ණ කිරීමට යෝජිතය.

**2.** *2016.02.25* වන දිනැති හා අංක *03/2016* දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ **MN 07-2016** වැටුප් කාණ්ඩය මෙම තනතුරට හිමි වන අතර ඒ අනුව මාසික වැටුප් පරිමාණය රුපියල්. **41,580 – 11x755, 10x1080 – 68,425/=** ක් වේ.

**3. ඇගයීමේ ක්‍රමය**

උතුරු පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියට 31.03.2021 දිනට පුරප්පාඩු සංඛ්‍යාව 19 ක් වේ. මෙම පුරප්පාඩුවලින් 50% ක් ප්‍රවීනතා මට්ටමින් සම්පූර්ණ කරනු ලබන අතර, සම්පූර්ණ කිරීමට අපෙක්ෂා කරන පුරපාඩු ගණනය අධි ශ්‍රේණියට පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ප්‍රවීනතා මට්ටමින් හෝ සීමිත මට්ටමින් පැවැත්වීමට නියමිත තරග විභාගයෙන් පළමුවෙන් පැවැත්වෙන තරග. විභාගයේ අවසන් දිනට ගණනය කරනු ලැබේ. එම පුරප්පාඩු ගණන අදාළ විභාගයේ අවසන් දිනට පසුව නැවත ප්‍රසිද්ධ දැන්වීමක් මගින් නිවේදනය කිරීමට කටයුතු කරන අතර ප්‍රසිද්ධ කිරීමෙන් අනතුරුව පුරප්පාඩු ගණන නැවත සංශෝධනය කරනු ලැබේ.

මෙ අනුව උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට විභාග කොමසාරිස් මගින් පවත්වනු ලබන අභියෝග්‍යතා විෂය අධ්‍යයනය ලිඛිත විභාගයට අවම ලකුණු 40 ක් ලබාගෙන සමත්විය යුතුයි. එම ප්‍රතිඵල මත හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණය මගින් අයදුම්කරුගේ ජ්‍යෙෂ්ඨතාවය හා පළපුරුද්ද යනාදී කරුණු පදනම් කරගෙන ලකුණු ප්‍රදානය කරන අතර සපුරා ඇති සුදුසුකම් ද පරීක්ෂා කරනු ලැබේ. ලිඛිත විභාගයෙන් ලබාගත් ලකුණු හා ජ්‍යෙෂ්ඨතාවය හා පළපුරුද්ද මත ලබාගත් ලකුණු වල සම්පූර්ණ එකතුවට සරිලන පරිදි අපෙක්ෂකයන්ගේ සියළු දෙනාගේ ප්‍රවීනතාවයන් වෙන් වෙන්ව තීරණය කරනු ලැබේ.

- අභියෝග්‍යතා විෂය අධ්‍යයනය (ලිඛිත විභාගය) ලකුණු – 100 (පැය 1 $^1/_2$)
- ජ්‍යෙෂ්ඨ තත්වය **ලකුණු** 60
- පළපුරුද්ද **ලකුණු** 40

**සම්පූර්ණ ලකුණු ප්‍රමාණය ලකුණු 200**

**3.1. අභියෝග්‍යතා විෂය අධ්‍යයනය - ලිඛිත විභාගය (පැය 1 $^1/_2$, ලකුණු 100 )**

මෙම විභාගය පැවැත්වෙන දිනය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් දැනුම් දෙනු ලැබේ. අභියෝග්‍යතා හා විෂය අධ්‍යයනය සම්බන්ධ ලිඛිතා විභාගය ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.

**(අ) කොටස - I (ලකුණු 40)**

සියළුම ප්‍රශ්නවලට කාර්යාල කළමනාකරණය සමග සම්බන්ධ වන අතර සාමාන්‍ය දැනුම, තීරණ ගැනීමේ හැකියාව, තර්කානුකූල විසඳුම් ලබාදීමේ හැකියාව හා කාර්යාල කළමනාකරණය සම්බන්ධයෙන් ගැටළුද ඉදිරිපත් කරනු ලැබේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි.

**(ආ) කොටස - II (ලකුණු 60)**

කාර්යාල කළමනාකරණය සමග සම්බන්ධ විෂය අධ්‍යයන ප්‍රශ්නවලට අදාළව පිළිතුරු සපයන ලෙස අපේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. මෙම ප්‍රශ්න පත්‍රය එක් ජේදයක් හෝ යම් ජේදයන්ගෙන් සමන්විත වේ.

**3.2. සේවා ජ්‍යෙෂ්ඨතාවය**

පළාත් කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ වසර **05** ක් සක්‍රිය හා සතුටුදායක සේවයක් සම්පූර්ණ කළ පසු, නිලධාරීන් සම්පූර්ණ කරන එක් එක් වසරක සක්‍රිය හා සතුටුදායක සේවය සඳහා ලකුණු 06ක් බැගින් අවම ලකුණු 60ක සීමාව තුළ සේවා ජ්‍යෙෂ්ඨතාවය වෙනුවෙන් ලකුණු ප්‍රදානය කරනු ලැබේ. මෙම ඉලක්කය සඳහා වසරකට අඩුනොවූ නමුත් මාස 06කට වැඩි කාලපරිච්ඡේදය සඳහා ලකුණු **03** ක් ප්‍රදානය කෙරේ. **06**කට අඩු කාලපරිච්ඡේදය සඳහා ලකුණු කිසිවක් ප්‍රදානය කරනු නොලැබේ.

වසර 15වෙන් I වන ශ්‍රේණියට තනතුරු උසස් කරනු ලැබූ නිලධාරීන් සඳහා ද 2013.04.02වන දින නව සේවා ව්‍යාවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක වන දින II වන ශ්‍රේණියට පත්වීම් ලබා වසර 10 ක් ඉක්මවූ සියළුම නිලධාරීන් ග්‍රේඩ් II වන ශ්‍රේණියට පත්වීම් ලබා වසර 10 ක් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව II වන ශ්‍රේණියේ සිටි අතිරේක වර්ෂ සඳහා ලකුණු 03 බැගින් ප්‍රදානය කරනු ලැබේ.

**3.3. පළපුරුද්ද**

පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ I වන ශ්‍රේණියේ අධීක්ෂණ නිලධාරියෙකුව සිටි එක් එක් වසර සඳහා වූ සතුටුදායක සේවය සඳහා ලකුණු **02** බැගින් උපරිම ලකුණු 40කට යටත් කර ලකුණු ප්‍රදානය කරනු ලැබේ.

**සටහන:** සේවා ජ්‍යෙෂ්ඨතාවය හා පළපුරුද්ද යනාදිය සඳහා ලකුණු ප්‍රතිපාදනය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිසම විසින් අනුමත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ. අයදුම්කරුවන්ගේ සේවා ජ්‍යෙෂ්ඨතාවය හා පළපුරුද්ද සම්බන්ධයෙන් අන්තර්ගත කරන ලකුණු එම නිලධාරියාගේ පෞද්ගලික ලිපිගොනුව පදනම් කර ඇගයීමට ලක් කරනු ලැබේ. මෙම ක්‍රියාවලියේදී සාවද්‍ය තොරතුරු අන්තර්ගත කර ඇති බවට අනාවරණය වන විට රාජ්‍ය සේවා කොමිසම් සභාවේ උපදෙස් වලට යටත්ව **අයදුම්කරුවන්ට හා එම අයදුම්පත් සහතික කරන දෙපාර්තමේන්තු ප්‍රධානියාට විරුද්ධව කටයුතු කරනු ලැබේ.** පෞද්ගලික ලිපිගොනුව මගින් සහතික නොවන සුදුසුකම් සම්බන්ධයෙන් ලකුණු ප්‍රදානය කරනු නොලැබේ

**4.** මෙම අරමුණ සඳහා පැවැත්වෙන ලිඛිත පරීක්ෂණය **2021 ජූලයි මස** කොළඹදී පැවැත්වේ. මෙම විභාගය කල්දැමීමට හෝ අවලංගු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලතල පැවරී ඇත.

**5. සුදුසුකම් :-**

උතුරු පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි ශ්‍රේණියට ප්‍රවීනතා මට්ටමින් .තනතුරු උසස් කිරීම සඳහා අයදුම් කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුයි.

5.1. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට **(2021.05.10වන)** පළාත් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ I ශ්‍රේණියේ අවම වසර 05ක් සක්‍රිය සේවා කාලයක් හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු විය යුතුයි

5.2. එදිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක01/2020 හි සඳහන් කර ඇති විධිවිධානයන් පරිදි විනය දඬුවමකට ලක්නොවී තිබීම

5.3. අදාළ දිනට අදාළ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර තිබීම.

**6. අයදුම් කරන ක්‍රමය :-**

**(අ)** මෙම චක්‍රලේඛය සමග අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල අයදුම්පත සකස් කර ගත යුතුයි, අතනෙ (A4) ප්‍රමාණයේ කඩදාසියක පැති දෙකම භාවිතා කර තම අත්අකුරුවලින් සම්පූර්ණ කළ යුතුයි. ***01 සිට 04*** දක්වා පළමු පිටුවේද, ***05 සිට 09*** දක්වා දෙවන පිටුවේද ඉතිරි කොටස් තුන්වන පිටුවේද අන්තර්ගත වන පරිදි සකස් කර ගත යුතුයි. අයදුම්පත්‍රයේ **අංක10** සම්බන්ධයෙන් සඳහන් කර ඇති පළපුරුද්ද සහතික කිරීමට ගැළපෙන ලිපිලේඛනවල සහතික කරන ලද පිටපත් අනුපිළිවෙළින් අයදුම්පත් සමග අමුණා එවිය යුතු අතර පසුව ඉදිරිපත් කරන ලියකියවිලි සඳහා ලකුණු ප්‍රදානය කරනු නොලැබේ. ලිපිලේඛනවල මගින් සහතික කරනු ලබන සේවා කාලයට පමණක් ලකුණු ප්‍රදානය කරනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන හා සම්පූර්ණ තොරතුරු නිවැරදිව සපුරා නැති අයදුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එමෙන්ම සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් තමා වෙත තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

**(ආ)** මෙම විභාගය දෙමළ සිංහල ඉංග්‍රීසි යන භාෂා මධ්‍යයන් මගින් පැවැත්වීමට නියමිතය. අපේක්ෂකයන් තමන් සේවයට බැඳීම සඳහා විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ වෙනත් රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය යුතුයි **අයදුම්පත්‍ර සකස් කරන විට විභාග අපේක්ෂක තමා ලිඛිත විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂාවෙන්ම මාධ්‍යයෙන්ම එය සම්පූර්ණ කළ යුතුයි.** විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ. සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයෙන් අයදුම්පත්‍ර සකස් කරන විට අමතරව ඉංග්‍රීසියෙන් ද විභාගයේ නම සඳහන් කළ යුතුයි.

**(ඇ)** නිසි පරිදි අයදුම්පත්‍රය සකස් කර අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා/පළාත් අමාත්‍යාංශයේ ප්‍රධානියා මගින් **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, *393/48*, කෝවිල් වීදි, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට **2021.05.05**වන දිනට හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි අයදුම්පත් බහාලන ලිපිකවරයේ වම් කොටසේ ඉහළ කෙළවරේ **"පළාත් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධිශ්‍රේණියට ප්‍රවීනතා මට්ටමින් තනතුරු උසස් කිරීමේ විභාගය - 2019(2020)"** යනුවෙන් සඳහන් කළ යුතුයි

**(ඇ)** නිලධාරීන් විසින් විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර යොමු වූ දිනට අදාළ දෙපාර්තමේන්තුවේ/ අමාත්‍යාංශයේ නිල මුද්‍රාව තැබීම හා පළපුරුද්ද සහතික කිරීමට ලියකියවිලි අයදුම්පත්‍රයේ අංක 19 ඡේදය සහතික කරන හා සහතික කළ දිනය සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට ප්‍රථම ඉහත ලිපිනයට යොමු වන පරිදි යැවීමට කටයුතු කිරීම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ / පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ වගකීම වේ.

**(ඉ)** සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත ක්‍රමයේ මණ්ඩලයක සේවය සඳහා තාවකාලිකව මුදාහැර ඇති / සේවය සඳහා ද්විකරණය කර ඇති නිලධාරීන්ගේ අයදුම්පත්‍ර සහතික කර ඉදිරිපත් කරන විට අදාළ පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් උක්ත උපදෙස් පිළිපැදිය යුතුයි.

**(ඊ)** අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබෙ. තැපෑලෙන් නැතිවූ හා ප්‍රමාදවන අයදුම්පත්‍ර සම්බන්ධයෙන් වූ පැමිණිලි මෙම නිවේදනය මගින් දී ඇති ලිපිනයට හැර වෙනත් පුද්ගලයන්ට යොමු කරන අයදුම්පත්‍ර සම්බන්ධයෙන් පැමිණි සැලකිල්ලට ගනු නොලැබේ.

උ) සෑම නිලධාරීන් සම්බන්ධයෙන් ලැබෙන අයදුම්පත්‍ර අයදුම්කරුවන්ගේ නාම ලේඛනයේ උතුරු පළාත් අන්තර්ජාලයෙන් **(www.np.gov.lk)** නිකුත් කරනු ලැබේ.

**(ඌ)** විභාගයට අයදුම් කරන අවස්ථාවේදී අයදුම්කරුගේ තනතුර සේවා ස්ථානය විභාගය හා සබැඳි සියළුම තොරතුරු අදාළ වන අතර අයදුම්පත් යොමු කළ පසුව මේ සම්බන්ධයෙන් සිදු කරන යම්කිසි නිවැරදි කිරීමක් සැලකිල්ලට ගනු නොලැබේ

## 7. විභාග ගාස්තු

විභාග ගාස්තුව රුපියල් 600/- ක් වේ. උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ**,** ***3401*** වන තැන්පත් ගිණුමට මුදල් ගෙවන ලද කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අදාළ කොටුව තුළ නොගැලවෙන සේ ඇලවිය යුතුයි. **විභාග ගාස්තුව වශයෙන් මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ.** කුවිතාන්සියේ පිටපතක් තමා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකියි. මෙම ගාස්තුව නැවත ගෙවන්නේ නැති අතර වෙනත් විභාගයන් සඳහා මාරු කිරීමට ද අවසර දෙනු නොලැබෙ.

## 8. විභාගයට අනුමත කිරීම -

**(අ)** ලිඛිත විභාගයට අයදුම්පත් භාරගන්නා ලද අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විභාගයට පෙනී සිටින විභාග අපේක්ෂකයන් ප්‍රවේශපත්‍රයේ තම අත්සන විභාගයට ප්‍රථම සහතික කරගත යුතුයි ප්‍රවේශපත්‍ර විභාගයේ දී විභාග මධ්‍යස්ථාන අධීක්ෂණ නිලධාරියා වෙත භාරදිය යුතුයි. සහතික කරන ලද ප්‍රවේශපත්‍ර නැතිව විභාග අපේක්ෂකයන්ට විභාගයට පෙනී සිටිය නොහැකි අතර විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණ අවසන් තීරණය වේ.

**(ආ)** විභාග අපේක්ෂකයන් තමන්ට වෙන්වූ විභාග මධ්‍යස්ථානයේ විභාගයට පෙනී සිටිය යුතුයි.

**(ඇ)** විභාග අපේක්ෂකයන්ට ප්‍රවේශපත්‍ර නිකුත් කළ පසු විභාග දෙපාර්තමේන්තුව මගින් පුවත්පත් දැන්වීමක් මගින් ඒ බව දැනුම් දෙනු ලැබේ. එම නිවේදනය නිකුත් කර දින 03 ක් ඇතුළත ප්‍රවේශපත්‍ර ලැබුණේ නැති අපේක්ෂකයන් කිවේදනයේ දන්වා ඇති පරිදි විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන කිරීම (ආයතන හා විදේශ විභාග) ශාඛාවට දැනුම් දිය යුතුයි. අයදුම්පත්‍ර, විභාග ගාස්තු ගෙවා ඇත්නම් එහි පිටපත සමග විභාග අපේක්ෂකගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම යනාදි තොරතුරු සමග විභාග දෙපාර්තමේන්තුවට දැන්විය යුතුයි කොළඹින් බාහිර අයදුම්කරුවන් ඉහත තොරතුරු සමග ආවරණ ලිපියක් හා ප්‍රවේශ පත්‍ර යොමු කිරීමට *ැක්ස් අංකයක් සඳහන් කර *ැක්ස් මගින් විභාග දෙපාර්තමේන්තුවට යොමු කළ යුතුයි.

**(ඈ)** ලිඛිත විභාගයේ ලකුණු හා සේවා ජ්‍යෝෂ්ඨතාවය හා පළපුරුද්ද යනාදියට ප්‍රධානය කරන ලකුණුවල සම්පූර්ණ ගණනයට අනුව ප්‍රවීනතා අනුපිළිවෙළ අනුව සකස් කරන ලද ප්‍රතිඵල ලේඛනය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිවේදනය පරිදි ලේකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබේ. විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් සියලු දෙනාටම පුද්ගලික වශයෙන් ප්‍රතිඵල ලබා දීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk යන අන්තර්ජාලයෙන් පළ කරනු ලැබේ.

**සටහන** - විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම යනු අයදුම්කරුවන් සියලුම සුදුසුකම් සපුරා ඇති බවට අදහස් කිරමක් නොවන බව සැලකිය යුතුයි.

9. අපේක්ෂකයන් තමන් පෙනී සිටින සියළුම විෂයයන් සඳහා විභාග ශාලා අධීක්ෂණ නිලධාරි තෘප්තිමත් වන පරිදි තම අනන්‍යතාවය සනාථ කළ යුතුයි. අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් කුමක් හෝ එකක් පිළිගනු ලැබේ :-

(අ) පුද්ගලයින් ලියාපදිංචි දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ආ) වලංගු ගුවන් බලපත්‍රය.
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

10. **සාවද්‍ය තොරතුරු සඳහා දඬුවම්-**

**(අ)** මෙම විභාග පටිපාටින් ප්‍රකාර කවර හෝ විභාග අපේක්ෂකයෙක් විභාගයට පෙනී සිටීමට සුදුසුකම් සපුරා නැති බවට අනාවරණය වන විට විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන විට හෝ විභාගයෙන් පසුව හෝ කුමණ අවස්ථාවක වුවද අපේක්ෂකයාගේ විභාගයට සඳහා ඇති හිමිකම් සියල්ල අහෝසි කරනු ලැබේ.

**(ආ)** විභාග අපේක්ෂකයෙක් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදිතාවයකින් තොර බව අනාවරණය වුවහොත හෝ යම් කිසි කරුණක් වුවමනාවෙන්ම සැගවූ බව අනාවරණය වුවහොත් එම අපේක්ෂකයා පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබේ.

**(ඇ)** විභාග පැවැත්වීම සම්බන්ධයෙන් වූ විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවන ලද රීතින් හා කාර්ය පටිපාටින්වලට සියලුම විභාග අපේක්ෂකයන් යටත් විය යුතු අතර එම රීතින් පැහැර හැරීමෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවන දඬුවමකට යටත්වීමට සිදුවේ.

11. **පත්වීමට තෝරා ගැනීම :-**

ලිඛිත විභාගයෙන් ලබා ගන්නා සම්පූර්ණ ලකුණු, සේවා ජ්‍යෙෂ්ඨතාවය හා පළපුරුද්ද යනාදියට එකගව ප්‍රවිනතා මට්ටම සැලකිල්ලට ගෙන එම අනුපිළිවෙළ අනුව පුරප්පාඩුවලට සරිලන පරිදි විභාග අපේක්ෂකයින් පත්කිරීමට තෝරා ගනු ලැබේ. (ලිඛිත විභාගයෙන් අවම වශයෙන් ලකුණු 40ක් අනිවාර්යයෙන් ලබාගත යුතුයි. ලකුණු 40ට අඩුවෙන් ලබා ගන්නා ලකුණුවලට මෙම තනතුර සඳහා සුදුසුකම් නොලැබේ)

12. විභාගයෙන් සමත්වන කිසියම් අපේක්ෂකයෙන් පත්වීම් ප්‍රදානය කරන අවස්ථාවේදී බලගැන්වී තිබූ කාර්ය පටිපාටින් හා විධිවිධානයන්ට අනුකූලව පත්වීම් ලැබීමට සුදුසුකම් නැති බව සලකනු ලැබුවහොත් හෝ වැඩ හා හැසිරීම සතුටුදායක නොවන බව සලකනු ලැබුවහොත් පත්වීම අහෝසි කිරීමේ හිමිකම් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුයි.

13. සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු හෝ කිසියම් පුරප්පාඩුවක් සම්පූර්ණ නොකර සිටීමට තිරණය කිරීමට හා මෙහි සඳහන් නොවූ යම් කරුණක් සම්බන්ධයෙන් තීරණය කිරීමට ලේකම් රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන චක්‍රලෙඛ පදනමින් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලතල හිමි වේ.

14. මෙම චක්‍රලේඛයේ දෙමළ, සිංහල භාෂා පාඨයන් අතර කිසියම් අනනුකූලතාවයක් ඇති වන අවස්ථාවකදී දෙමළ භාෂා පාඨයට අනුකූලව කටයුතු කළ යුතුයි .

***" අංක 07/2021,දරණ 09.04.2021වන දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුගමනය කර මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ"***

**S. තිරුචාකරන්.**
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
16.04.2021